# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2024 අංක 32 දරන
## අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය
## (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 ජුනි මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---


2024 ජුනි මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 24.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2024 අංක 32 දරන අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2024 ජූනි මස 18 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 4/2023

## අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

''අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන ආයතනයක්, එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එහි පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඊට අදාළ සියලු කරුණු ඵලදායී ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එම පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, එම ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2024 අංක 32 දරන අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු ''ආයතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) අන්තර්ජාතික ථේරවාද ධර්මායතනයේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාපිත මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය සංස්ථාගත කිරීම

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** (1) යම් අදාළ ලිඛිත නීතියක් මගින් අවසර ලබා දෙන ප්‍රමාණයට එම නීතියට යටත්ව, සංස්ථාපිත මණ්ඩලය පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) බෞද්ධ ඉගැන්වීම්වලට අනුව උත්තරීතර විමුක්තිය වන නිර්වාණය තනිව සාක්ෂාත් කිරීමට අවශ්‍ය ධර්ම විනය ඥානයන් සහ භාවනා පිළිබඳ ඥානයෙන් යුක්ත වූ ගිහි පැවිදි පිරිසක් බිහි කිරීම;

(ආ) බෞද්ධ ඉගැන්වීම්වලට අනුව උත්තරීතර විමුක්තිය වන නිර්වාණය සාක්ෂාත් කර ගැනීම සඳහා අනෙකුත් ගිහි පැවිදි දෙපාර්ශ්වයට මඟ පෙන්වීමට සමර්ථ වූ ගිහි පැවිදි පිරිසක් බිහි කිරීම;

(ඇ) ථේරවාද බෞද්ධ ඉගැන්වීම්වලට අනුව නිවැරදිව විනය කර්ම සිදු කිරීම මගින් ශාසනය අවිච්ඡින්නව පවත්වා ගෙන යාමට සමර්ථ වූ බෞද්ධ භික්ෂූන් වහන්සේලා බිහි කිරීම;

(ඈ) ථේරවාද ඉගැන්වීම්වලට අදාළ පොත් සහ වෙනත් යම් කියවීම් මූලාශ්‍ර පළ කිරීම සහ පරිවර්තනය කිරීම; සහ

(ඉ) පවතින නීති සහ සංස්කෘතික වටිනාකම්වලට ගරු කරමින් දේශීය සහ විදේශීය වශයෙන් බුදුරජාණන් වහන්සේ විසින් අර්ථ විවරණය කරන ලද ධර්මය ලොව පුරා ප්‍රචාරණය කිරීම සඳහා ධර්ම දූතයන් පුහුණු කිරීම සහ යොදා ගැනීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, එහි පරමාර්ථ, ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී-පුරුෂ භේදය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ වෙනත් හේතූන් මත පදනම් කරගත් වෙනස්කමකට භාජනය නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට සංස්ථාපිත මණ්ඩලය විසින් වගබලා ගත යුතු ය.

රජයේ හෝ පළාත් සභාවක, අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ අතර ගැටුම් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු බව

4. රජයේ හෝ යම් පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය අතර, කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

5. (1) මේ පනතේ විධිවිධානවලට සහ 10 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතීන්ට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම, මේ පනතේ 10 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත විධායක මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විධායක මණ්ඩලයේ ධුර දරන සාමාජිකයන් විසින්, මේ උපවගන්තියේ (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතීන්ට යටත්ව, මේ පනතේ 10 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් දක්වා ඇති ආකාරයට ප්‍රථම විධායක මණ්ඩලය පත් කරනු ලබන තෙක් හෝ තෝරා පත් කරනු ලබන තෙක්, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලය ලෙස ක්‍රියා කළ යුතු ය.

(ආ) 10 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සඳහා සහ සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම විධායක මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම හෝ පත් කර ගැනීම සඳහා රීති සෑදීමට සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලයට බලය ඇත්තේ ය.

(ඇ) යම් රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරයක් විසින් අතුරු මණ්ඩලයේ යම් තීරණයක් ගනු ලැබිය යුතු ය.

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට අවුරුද්දක කාලයක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම විධායක මණ්ඩලය පත් කරනු ලැබීම හෝ තෝරා පත් කරනු ලැබීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ද ඇතුළුව විධායක මණ්ඩලයේ සෑම ධුර දරන්නකු ම අවුරුදු හයක කාලයක් සඳහා පත් කර ගත යුතු හෝ තෝරා පත් කර ගත යුතු අතර, එම ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත් කර ගැනීම හෝ නැවත තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සකු වන්නේ ය:

එසේ වුව ද, විධායක මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ යම් තැනැත්තකු, අනුගාමී හෝ අන්‍යාකාරයකින් තවදුරටත් එක් කාලයක් සඳහා පමණක් නැවත පත් කර ගැනීම හෝ නැවත තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(ආ) යම් ධුර දරන්නකු මියයාම, ඉල්ලා අස්වීම, යම් අශක්නුතාවකට පත් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවකදී, විධායක මණ්ඩලය විසින් සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු පත් කර ගැනීම හෝ තෝරා පත් කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ පත් කර ගනු ලබන හෝ තෝරා පත් කර ගනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුර දැරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ සනාතන සභාව

**6.** ධර්මය හා විනය සම්බන්ධයෙන් වන ගැටලු සහ විධායක මණ්ඩලය විසින් ගනු ලබන තීරණ සාකච්ඡා කිරීම සඳහා සහ එම ගැටලුවලට අදාළ විවේචන, අදහස්, යෝජනා සහ නිර්දේශ සංස්ථාපිත මණ්ඩලය සහ විධායක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා සංස්ථාපිත මණ්ඩලයේ ගුරු ස්වාමීන් වහන්සේලාගෙන් සහ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලාගෙන් සමන්විත සනාතන සභාව යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මහා සභාව

**7.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මහා සභාව, උත්තරීතර මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය සංස්ථාවේ සියලුම සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේ ය.

(2) 10 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ විධායක මණ්ඩලය, සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගැනීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය වෙනත් ස්ථානයකට ගෙන යාමට අදාළ තීරණ ගැනීම;

(ඇ) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට අදාළ තීරණ ගැනීම;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ රීති සකස් කිරීම සහ සංශෝධනය කිරීම;

(ඉ) මහා සභාවේ කාර්යපටිපාටීන්, සංස්ථාපිත මණ්ඩලයේ රීති මගින් සකස් කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ විධායක කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා විධායක මණ්ඩලයක් පිහිටුවීම;

(උ) විධායක මණ්ඩලය සඳහා සාමාජිකයන් මහා සභාවෙන් ඡන්දයකින් තෝරා පත් කිරීම; සහ

(ඌ) විධායක මණ්ඩලයේ සංයුතිය, විධායක මණ්ඩලය යටතේ පවතින උපකමිටු, ඒවායේ කාර්යයන් සහ එකී උපකමිටුවල සාමාජිකයන්ගේ සුදුසුකම් සහ පත්වීම් රීති මගින් සකස් කිරීම,

මහා සභාවේ කාර්යය වන්නේ ය.

සංස්ථාපිත මණ්ඩලයේ විනය කමිටුව

**8.** (1) සංස්ථාපිත මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ට සහ පුහුණු හා පුහුණුව ලබන්නන්ට අදාළ සියලුම විනය කරුණු පරීක්ෂා කිරීම සඳහා විනය කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන කමිටුවක් තිබිය යුතු ය.

(2) විනය කමිටුවේ සංයුතිය, බලතල, කර්තව්‍ය සහ කාර්යයන් මේ පනතේ 10 වන වගන්තිය යටතේ සාදන ලද රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**9.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ හෝ ඒ අතරින් කුමන හෝ යම් පරමාර්ථයක් ඉටු කර ගැනීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා හා දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාපිත මණ්ඩලයට ඇත්තේ ය:-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිල දී ගැනීම, කුලියට ගැනීම, ඉදි කිරීම සහ අලුත්වැඩියා කිරීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව විධායක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිදි සෘජුව හෝ සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් බලය පවරන ලද නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් යම් කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට ඇතුළත් වීම, ක්‍රියාත්මක කිරීම හෝ කරගෙන යාම;

(ඇ) ඇප සහිතව හෝ රහිතව අරමුදල් ණයට ගැනීම හෝ රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලය වෙත දෙනු ලබන සියලුම විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් විධායක මණ්ඩලය විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට සහ නිකුත් කිරීමට සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙ යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් විධායක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකින් ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති යම් නීත්‍යානුකූල භාරයක් හෝ යම්

නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) 10 වන වගන්තිය යටතේ සාදන ලද රීති ප්‍රකාර සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ අනෙකුත් සේවානියුක්තයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම සඳහා අදාළ අධිකාරීන්ට සහාය ලබා දීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති අනෙකුත් දේශීය හා විදේශීය ආයතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම; සහ

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී නිලධරයන් සහ අනෙකුත් සේවානියුක්තයන් පුහුණු කිරීම.

සංස්ථාවේ රීති

**10.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, කලින් කල, යම් මහ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත සඳහන් සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ, එහි විධායක මණ්ඩලයේ, සනාතන සභාවේ සහ විනය කමිටුවේ ධුර දරන්නන්ගේ සංඛ්‍යාව සහ අවස්ථාවෝචිත පරිදි, සංස්ථාපිත මණ්ඩලයේ එහි විධායක මණ්ඩලයේ, සනාතන සභාවේ හෝ විනය කමිටුවේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ, එහි විධායක මණ්ඩලයේ, සනාතන සභාවේ ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන් සහ අනෙකුත් සේවානියුක්තයන් පත් කිරීමේ නියම හා කොන්දේසි, ඔවුන්ගේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්,

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ සහ විධායක මණ්ඩලයේ, සනාතන සභාවේ සහ විනය කමිටුවේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය හෝ රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම කළමනාකරණය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීති, එකී රීති සාදනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එහි සඳහන් දින සිට ඒවා ක්‍රියාත්මක විය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද සෑම රීතියක් ම, එම රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් රීතියක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන යම් රීතියක්, එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(6) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම විටක දී ම සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

සාමාජික නාමලේඛනය

**11.** සාමාජිකයන්ගේ නම්, ලිපින සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරන ලද සාමාජිකයන්ගේ නාමලේඛනයක් විධායක මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**12.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලුම මුදල්, 9 වන වගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, විධායක මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ ගිණුමේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**13.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින්, එහි ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කර සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් ඇත්තේ ද, එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව

**14.** (1) විධායක මණ්ඩලය විසින් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහාම සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කර, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමඟ, වාර්තාව අදාළ වන වසරට පසුව දී තිබෙන වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාපිත මණ්ඩලය වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට අමුණනු ලැබිය යුතු ය.

ආයතනය විසින් ගෙවිය යුතු සහ ආයතනයට අය විය යුතු ණය

**15.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට ආයතනයට අය විය යුතු සියලු ණය සහ ආයතනයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

**16.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතු වන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට, නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, එම දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, 10 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව

**17.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් හා දේපළ, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කිසිදු කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ මුදල්, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් ඍජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම

**18.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, විධායක මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනකු ඉදිරිපිට දී මිස, කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණි සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, විධායක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි විධායක මණ්ඩලයේ යම් ධුර දරන්නකු භාරයේ තිබිය යුතු ය.

**19.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් යම් උචිත ආයතනයකට එම දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් සභාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**20.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අර්ථ නිරූපණය

**21.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

''බැංකුව'' යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් වේ;

''ලිඛිත නීතිය'' යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එම යෙදුමට ලබා දී ඇති අර්ථය ම තිබිය යුත්තේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**22.** මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.